**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

-----------------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල අතර 2012 ඔක්තෝබර් 08 දින එළඹි අංක 1452 පී දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

මාර්ග ජාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ මූලික කොටසක් ලෙස සහ බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පලාත් වල පාලම් පුළුල් කිරීම හා යලි ඉදිකිරීම මෙන්ම ජාතික මහා මාර්ග කිලෝමීටර 202 ක් වැඩිදියුණු කිරීම මගින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සීඝ්‍රයෙන් වර්ධනය වන ඉල්ලුමට සරිලන පරිදි මාර්ග පද්ධතියේ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමේ ඉලක්කයන් ව්‍යාපෘති අරමුණු වල ඇතුළත් වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,092.77 කට සමාන එ.ජ.ඩො. මිලියන 62.21 ක් වූ අතර එයින් රු. මිලියන 4,560 කට සමාන එ.ජ.ඩො. මිලියන 40 ක් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් ලබාදීමට එකග වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කළ අතර 2016 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර

පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

------------------------------------------

ඇහැලියගොඩ-දෙහිඕවිට මාර්ගයේ හා දෙනියාය-මාදම්පේ මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ සඳහා තෝරා ගත් කොන්ත්‍රාත්කරුවන් විසින් අසාමාන්‍ය රේට් සහිත මිල ගණන් ඉදිරිපත් කිරීම මත අධික අවදානම අඩුකර ගැනීම සඳහා ජාතික මිලදී ගැනුම් මාර්ගෝපදේශයේ 7.9.11 (ඇ) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව ඉහල වටිනාකම් වල කාර්ය සාධන ආරක්ෂණ බැඳුම්කර ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො. (මිලියන) | රු.(මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු.(මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| ජා.සං.ඕ.අ. | 40.00 | 4,560.00 | 1,842.21 | 12.88 | 1,673.91 | 15.55 | 2,023.57 |
| ශ්‍රී.ලං.ර | 22.21 | 2,532.77 | 24.01 | - | 25.20 | - | 49.66 |
| | **62.21** | **7,092.77** | **1,866.22** | **12.88** | **1,699.11** | **15.55** | **2,073.23** |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් වසර 02 ක් ඉකුත් වීමෙන් පසුවද ණය මුදලින් සියයට 38.8 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එමනිසා ඉතිරි වසර 02 ක කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනය භාවිතා කිරීමට වේගවත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සිදු වේ.

### 3.2 භෞතික ප්‍රගතිය

ඉදිරිපත් කළ තොරතුරු වලට අනුව, ව්‍යාපෘතිය විසින් පිරිනමන ලද කොන්ත්‍රාත් 04 ක 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය පහත පරිදි විය.

| මාර්ග | මාර්ගවල දිග | නිම කිරීමට අපේක්ෂිත දිනය | 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කගත | තථ්‍ය |
| | කි.මී. | | % | % |
| පොල්ගහවෙල-කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලම | - | 2014 දෙසැම්බර් 20 | 89 | 83 |
| ගාල්ල-දෙණියාය-මාදම්පේ මාර්ගය | 13.93 | 2014 දෙසැම්බර් 31 | 75 | 66 |
| ඇහැලියගොඩ-දෙහිඕවිට මාර්ගය | 16.69 | 2015 ජූනි 10 | 77 | 51 |
| ඇතුල්කෝට්ටේ-මිරිහාන-කොහුවල මාර්ගය | 5.95 | 2014 සැප්තැම්බර් 09 | 96 | 95 |
| | **36.57** | | | |

ලැබුණු තොරතුරු අනුව, ඉඩම් අත්පත් කරගැනීමේ ගැටළු හා අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ගාල්ල-දෙණියාය-මාදම්පේ මාර්ගයේ හා ඇහැලියගොඩ-දෙහිඕවිට මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ ප්‍රමාද විය. තවද, ගඟේ ජල මට්ටම ඉහළ යාම හා ඉදිකිරීම් කාලය තුළ දුර්වල රථවාහන කළමනාකරණය හේතුවෙන් පොල්ගහවෙල-කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලමෙහි ප්‍රතිසංස්කරණ වැඩ ප්‍රමාද විය.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 මාර්තු 31 දින විගණකවරුන් විසින් සිදු කළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී නිරීක්ෂණය වු ඇහැලියගොඩ-දෙහිඕවිට මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ වල අඩුපාඩු පහත විස්තර කෙරේ.

(i) රථ වාහන ආරක්ෂාව හා පාලනය සඳහා ප්‍රමාණ පත්‍රයේ රු. මිලියන 9.81 ක් ප්‍රතිපාදනය කර තිබුණද, එම අවශ්‍යතාවය සඳහා කොන්ත්‍රාත්කරු අඩු අවධානයක් ලබා දී තිබුණි. එමනිසා මාර්ග භාවිතාකරන්නන්ට සිදුවන අපහසුතා අවම කිරීමට සුදුසු පියවර ගැනීම සඳහා නේවාසික ඉංජිනේරු, කොන්ත්‍රාත්කරුට උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, ගැටළු විසඳීමට කොන්ත්‍රාත්කරු විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) මාර්ග නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණ පත්‍රයේ රු. මිලියන 6.90 ක් ප්‍රතිපාදනය කර තිබුණද එවැනි නඩත්තු වැඩ විධිමත්ව සිදුකර නොතිබූ අතර ස්ථාන කීපයකම මාර්ගය මතුපිට කුඩා සිදුරු මතුවී තිබුණි.

(iii) කොන්ත්‍රාත් ගිවිසුමේ 1802.4 (ඇ) වගන්තියෙහි ඇති තාක්ෂණික පිරිවිතරයන්ට අනුව තලන ලද මතුපිට තලයේ ලබා ගන්නා ලද සියළු සාම්පල වල ඝනකම පිහිටීමට අදාල ස්ථානයේ තිබිය යුතු ඝනකමෙන් සියයට 98 ට වඩා අඩු නොවිය යුතුය.කෙසේ වෙතත් ස්ථාන 09 ක සාම්පලවල පිරිවිතරයේ තිබිය යුතු මට්ටම නොමැති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරු විසින් එම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) ආරම්භක අවස්ථාවේදී මිල ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේ අඩුපාඩු වල ප්‍රතිඵලයක් ලෙස අතුරු පාදම (Sub base) වෙනුවට ඒබීසී (aggregated based course)සඳහා රු. මිලියන 30.68 ක් වටිනා විචලන නියෝග ඉදිරිපත් කර තිබුණි.

(ආ) ඇතුල්කෝට්ටේ-මිරිහාන-කොහුවල මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල නියුතු කොන්ත්‍රාත්කරු වෙත අතුරු ගෙවීම් පියවීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 14.8 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුව රු. මිලියන 1.58 ක් ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

දී ඇති උපදෙස් අනුව ව්‍යාපෘතියේ වැටුප් හා සේවක මණ්ඩලය සම්බන්ධයෙන් 2007 අප්‍රේල් 05 දිනැති චක්‍රලේඛ අංක 33 හි ප්‍රතිපාදනයන්ගෙන් ආවරණය නොවන අනිකුත් කරුණු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරියෙහි මහාමාර්ග සැලසුම් අංශයේ සේවකයින් සඳහා ඔවුන් විසින් සිදුකළ අමතර වැඩ වෙනුවෙන් ගෙවන ලද රු. මිලියන 2.35 ක් වටිනා දිරිදීමනා සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ මාර්ග සැලසුම් වැඩ සඳහා මහමාර්ග සැලසුම් අංශයේ සේවකයින් විසින් ලබා ගත් අමතර කාලය තහවුරු කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.